# 8 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## දෙවන වාරය

සැකසුම : ඉරේෂා වැඩිවරධන
හදපාන්ගොඩ මහා විද්‍යාලය

# උගනිමු අනුසැමි, හිත මිතුරු යුතුකම්

10 වන පාඩම



# සදිසා නමස්කාරය

- මාතා පිතා දිසා පුබ්බා
- ආචරියා දක්ඛිණා දිසා
- පුත්තදාරා දිසා පච්ඡා
- මිත්තාමත්තාච උත්තරා
- දාස කම්මකරා හෙට්ඨා
- උද්ධං සමණ බ්‍රාහ්මණා
- එතෙ දිසා නමස්සෙය්‍ය
- අලමත්තෝ කුලේ ගිහි

# සිඟාලෝවාද සූත්‍රය

- දිසා හයකින් යුතුව අඹුසැමි යුතුකම් ඉගැන්වීම
- ගිහි විනය ලෙස හැඳින්වීම
- අන්‍යොන්‍ය යුතුකම් ප්‍රකට කිරීම

# බටහිර දිශාව - අඹුසැමි සබඳතාව

- ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකම්

- භාර්යාව විසින් ස්වාමියාට ඉටු කළ යුතු යුතුකම්

# ස්වාමියා විසින් භාර්යාවට ඉටුකළ යුතු යුතුකම්

- සම්මාන කිරීම
- අවමන් නොකිරීම
- වෙනත් කාන්තාවන් කරා නොයෑම
- වගකීම් පවරා දීම
- ඇඳුම් පැළඳුම් පවරා දීම

# භාර්යාව විසින් ස්වාමියාට ඉටු කළ යුතු යුතුකම්

- ගෙදරදොර කටයුතු සංවිධානාත්මක ව කිරීම
- ස්වාමියාගේ ඥාති මිත්‍ර සේවකාදීන්ට මැනවින් සැලකීම
- වෙනත් පුරුෂයින් නොපැතීම
- උපයාගත් ධනය ආරක්ෂා කිරීම
- දක්ෂව අනලස්ව සියලු කටයුතු කිරීම

# යහපත් අඹුසැමි සබඳතාවයකින් සමාජයට ඇති වැදගත්කම

- පවුල් ආරවුල් අඩු වීම
- පවුල් සංස්ථාව සතුට, සාමය, සෞභාග්‍ය පිරුණු තැනක් වීම
- සාරධර්මවලින් පිරුණු පවුල් පසුබිමකින් අනාගත යහපත් පුරවැසියන් සමාජයට දායාද කිරීම

# හිත- මිතුරු සබඳතාවය







# හිත මිතුරන් ඇසුරු කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත්

- දානය
- ප්‍රියවචනය
- අර්ථචර්යාව
- සමානාත්මතාව
- නොරැවටීම

# කල්‍යාණ මිත්‍රයෙකුගේ ලක්ෂණ

- ප්‍රියජනක වීම
- ගරු බුහුමන් කිරීමට සුදුසු වීම
- දුටු වරද මෛත්‍රී සහගතව කරුණාවෙන් පෙන්වා දීම
- මිතුරා වරදක් පෙන්වා දෙන කල්හි නොකිපී මැනවින් පිළිගෙන පිළිපැදීම
- තමාටත් අනුන්ටත් අවැඩ පිණිස පවතින ඕපා දූප නොදොඩා, ගැඹුරු වූත් සාර වූත් කතා කීම

# කළණ මිතුරෙකු ලෙස තම මිතුරාට සැලකිය යුතු කරුණු

- පමා වූ මිතුරා රැක ගැනීම
- පමා වූ මිතුරාගේ ධනය රැක ගැනීම
- බිය පැමිණිවිට මිතුරාට පිහිට වීම
- ආපදාවන්හිදී හැර නොයෑම
- මිතුරාගේ දරු මුණුබුරන් ද ආරක්ෂා කිරීම